අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
චක්‍ර ලේඛ අංක: 23/ 1995.

මගේ අංකය : 2/මුපාඒ/පෞ. ප/8.
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
'ඉසුරුපාය' - බත්තරමුල්ල.

1995. 09. 18 වන දින

පෞද්ගලික ගාස්තු අය නොකරන,
සියලුම පාසල්වල කළමණාකරුවන් වෙත.

## පෞද්ගලික, ගාස්තු අය නොකරන පාසල්වල විශේෂ තනතුරු

අධ්‍යාපන අධ්‍යක්ෂ, එස්. එල්. ද සිල්වා මහතා විසින් 1958 දෙසැම්බර් මස 29 දින නිකුත් කරන ලද අංක ඒ එස් ඒ/963 දරන 1985 අංක 50 දරන චක්‍ර ලේඛය වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කරමි. 1958 අංක 50 දරන චක්‍ර ලේඛය මෙයින් අවලංගු කරමි.

ඔබේ පාසල්වල ඇතිවන විශේෂ තනතුරු පිරවීමේදී මෙම චක්‍රලේඛයේ උපදෙස් වලට අනුකූලව ක්‍රියාකරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි. මෙම චක්‍රලේඛය නිකුත් කිරීමට පෙර දිනක සිට විදුහල්වල තිබූ විශේෂ තනතුරු පිරිවීමේදීත් මෙම චක්‍රලේඛයේ උපදෙස් අදාල වේ.

ඔබ විදුහල්වල ඇති විශේෂ තනතුරු පිරවීමේදී පහත සඳහන් උපදෙස් මාලාවට අනුකූලව ක්‍රියාකළ යුතුය.

1 පාසලක විශේෂ තනතුරක පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක හෝ පාසලකට විශේෂ තනතුරක් ඇති කිරීමට හිමිකම් ලැබෙන අවස්ථාවක පාසලේ කළමණාකරු විසින් විදුහල්පති මගින් තනතුර පිරවීම සඳහා ඉල්ලුම්පත්‍ර කැඳවිය යුතුය. තනතුරක් සඳහා ඉල්ලුම්කරුවෙකු ට වැඩියෙන් සිටින අවස්ථාවක, කළමනාකරු විසින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුස්සෙකු තෝරාගත යුතුය. කළමණාකරුගේ තීරණය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් මගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය. මගේ අනුමැතිය ලැබීමෙන් පසු තෝරාගත් තැනැත්තාට පත්වීමේ ලිපිය නිකුත් කළයුත්තේ කළමනාකරු විසිනි. කළමනාකරුගේ තීරණයට එකඟ නොවන ඉල්ලුම්කරුවනට තමා සේවය කරන පාසලේ පාලක සභාවක් තිබේනම්, එම පාලක සභාවට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය. විධිමත් පරීක්ෂණයකින් පසු කළමනාකරුගේ තීරණය අනුමත කිරීමට හෝ වෙනස් කිරීමට පාලක සභාවට බලය ඇත.

2 (අ) පලවෙන් පන්තියේ විශේෂ තනතුරකට ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන්නේ පාසලේ වසර පහකට නොඅඩු සේවයක් හා ගුරුවරයකු වශයෙන් වසර දහයකට නොඅඩු සේවයක් ඇති පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකුට පමණි.

(ආ) ඉතා විශේෂ අවස්ථාවක සේවා කාලය පිළිබඳ කොන්දේසිය ලිහිල් කිරීමට කලමනාකරුට පුලුවන. කළමණාකරු එසේ කළයුත්තේ සේවා කාලය පිළිබඳ කොන්දේසිය ලිහිල් නොකළොත් පාසලේ තත්වය බරපතල ලෙස හානිවන බව ඔහුට ඒත්තු ගිය අවස්ථාවකදී පමණකි. එහෙත්, මෙසේ සේවා කාලය පිළිබඳ කොන්දේසිය ලිහිල් කිරීම යම්කිසි අපේක්ෂකයෙකුට අහිතකර ලෙස බලපානු ලබන්නේ නම්, එම තීරණයට විරුද්ධව පාසලේ පාලක මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අයිතියක් ඇත.

3 විශේෂ තනතුරු ප්‍රදානය කිරීමේදී පහත සඳහන් සුදුසුකම් සැලකිල්ලට ගත යුතුය.

i විශේෂ තනතුරු ඇති පාසලේත්, ගුරු වෘත්තියේත් ජ්‍යෙෂ්ඨත්වය

ii විභාග ප්‍රතිඵලවලින් අනාවරණය වන පරිදි ගුරුවරයෙකු වශයෙන් ලබා ඇති සාර්ථකභාවය.

iii ප්‍රශංසනීය සේවය - විද්‍යාලයේ උන්නතිය සඳහා, විශේෂ කැපවීමකින් කර ඇති අවංක හා දීඝ කලීන සේවය

iv තමාගේ සේවා කාලයේදී දරා ඇති වගකිව යුතු තනතුරු
විශේෂ තනතුරු හිස්වන අවස්ථාවේ මෙබඳු තනතුරක් දැරීම අත්‍යවශ්‍ය නොවේ. තමාගේ පාසල් ප්‍රධානියා ඇතුලු ගුරු මණ්ඩලය සමග සහයෝගයෙන්, සමගියෙන් කටයුතු කිරීම විශේෂ සැලකිල්ලට ගත යුතුය.

v ඉහල මට්ටමකින් කර ඇති සේවය
උදා :- අ. පො. ස (උ.පෙල) විභාගයේ විෂයයන් ඉගැන්වීම.
මෙය තමාගේ සේවා කාලයේ කවර අවස්ථාවක හෝ කර තිබීම සැලකිල්ලට ගත හැකි අතර, විශේෂ තනතුරට ඉල්ලුම් කරන අවස්ථාවේ එබඳු සේවයක යෙදීම අත්‍යවශ්‍ය නොවේ.

vi විශේෂ අධ්‍යාපනික හෝ වෘත්තීය සුදුසුකම් .
උදා:- පළවෙනි හෝ දෙවෙනි පන්තියේ උපාධියක්, පශ්චාත් උපාධි සුදුසුකම්, ශාස්ත්‍රීපති, අධ්‍යාපදීපති, හෝ ආචාර්ය උපාධියක් තිබීම. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාලව මෙරට හෝ විදේශ රටකදී සහභාගිවී ඇති පුහුණු පාඨමාලා, අධ්‍යාපනයේ කවර අංගයක් හෝ අලලා ලියා ඇති පොත් හෝ ලිපි

4 පහත සඳහන් වර්ගවල ගුරුවරුන්ට ද ii වෙනි තුන්වන ශ්‍රේණියේ තනතුරු වලට ඉල්ලීමට සුදුසුකම් ඇත.

ii වන ශ්‍රේණියේ විශේෂ තනතුරු
පුහුණුවෙන් පසු වෂ් 12 ක සේවයක් ඇති පුහුණු ගුරුවරු

iii වන ශ්‍රේණියේ විශේෂ තනතුර
පුහුණුවෙන් පසු වෂ් හතක සේවයක් ඇති පුහුණු ගුරුවරු

පාසලක සිටින විශේෂ තනතුරුධාරියකු පාසලේ කළමනාකරු විසින් තමාගේ පාලනය යටතේ ඇති විශේෂ තනතුරක පුරප්පාඩුවක් නොමැති පාසලකට මාරු කිරීමට අදහස් කරන්නේ නම්, එම මාරු යෝජනාව අදාල ගුරු මහතාගේ සේවය අවසන් කිරීමේ යෝජනාවක් ලෙස සලකා පෞද්ගලික ගාස්තු අය නොකරන පාසලක ගුරු භවතුන්ගේ සේවය අවසන් කිරීම සඳහා අනුගමනය කරන ක්‍රියාමාර්ගය අනුගමනය කළයුතුය.

මෙම චක්‍රලේඛය ලැබුණු බව මා වෙත දන්වා එවන්න.

එම් ඩී. ඩී. පීරිස්,
අධ්‍යාපන සහ උසස් අධ්‍යාපන ලේකම්

පිටපත්
1 සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්‍ෂවරු වෙත. - දැන ගැනීම සඳහා
2 සියලුම පෞද්ගලික ගාස්තු අය නොකරන පාසල්වල විදුහල්පතිවරු වෙත - දැන ගැනීම සඳහා
3 විගණකාධිපති
4 නීතිපති.